මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2021 අප්‍රේල් 12 |

# "ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී ආයතනයෙහි" ව්‍යාපාර කටයුතු අත්හිටුවීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 31(1) වන වගන්තිය ප්‍රකාරව, 2021 අප්‍රේල් මස 12 වන දින ප.ව. 5:00 සිට බලපැවැත්වෙන පරිදි ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී යන ආයතනයෙහි ව්‍යාපාර කටයුතු අත්හිටුවීම සඳහා තීරණය කරන ලදී.

ආයතනයේ මූල්‍ය තත්ත්වය අඛණ්ඩව පසුබෑමට ලක්වීම සහ නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි සාධනීය ආයෝජන යෝජනාවලියක් ඉදිරිපත් නොවීම හේතු කොටගෙන, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්, 2011 අංක 42 දරණ මුදල් ව්‍යාපාර පනතේ 31(1) වන වගන්තිය ප්‍රකාරව, 2020 ජූලි 13 වන දින සිට බලපැවැත්වෙන පරිදි ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී සහ එහි මව් සමාගම වන, ඊ ටී අයි ෆිනෑන්ස් ලිමිටඩ් යන ආයතන දෙකෙහි ව්‍යාපාර කටයුතු අත්හිටුවීම සඳහා 2020 ජූලි මස 10 වන දින තීරණය කරන ලද අතර, එම ව්‍යාපාර කටයුතු අත්හිටුවීම 2021 ජනවාරි 12 වන දින දක්වා බල පැවැත්වුණි. ව්‍යාපාර කටයුතු අත්හිටවූ මාස හයක (06) කාල සීමාව නිමවන විටද, ප්‍රාග්ධන යෙදවීමක් මඟින් ආයතනය නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි යෝජනාවලියක් ඉදිරිපත් වීමක් නොවූ අතර, ආයතනයෙහි මූල්‍ය තත්ත්වය අඛණ්ඩව පසුබෑමට ලක්විය.

ව්‍යාපාර කටයුතු අත්හිටුවීමේ කාල පරිච්ඡේදය තුළදී, ප්‍රධාන වශයෙන්ම රන් ණය ආපසු අය කර ගැනීම මඟින් සැලකිය යුතු මුදලක් රැස්කර ගැනීමට ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී යන ආයතනයට හැකි වූ අතර, එසේ අයකරගත් මුදල් භාවිතා කර ඔවුන්ගේ ඉතිරි තැන්පතු ගෙවීමට කටයුතු කරන ලෙස තැන්පත්කරුවන්ගෙන් ඉල්ලීම් ඉදිරිපත් විය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මහජනතාවගේ සහ තැන්පත්කරුවන්ගේ යහපත උදෙසා දැඩි කොන්දේසි වලට යටත්ව, මුදල් මණ්ඩලය විසින් පත් කරන ලද කළමණාකරන මණ්ඩලයේ අධීක්ෂණය යටතේ ආයතනයේ ඉතිරි තැන්පතු වලින් 50%ක ප්‍රමාණයක් ආපසු ගෙවීම සඳහා පමණක් 2021 ජනවාරි 13 දින සිට තෙමසක (03) සීමිත කාල සීමාවක් සඳහා ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී ආයතනයේ ව්‍යාපාර කටයුතු නාමිකව නැවත ආරම්භ කිරීමට තීරණය කරන ලදී. තැන්පතු ආපසු

ගෙවීමේ සැලැස්ම යටතේ ආයතනයෙහි ඉතිරි තැන්පත්කරුවන්ගෙන් සියයට අනූ හතරකට (94%) රුපියල් මිලියන 665.6 ක් 2021 මාර්තු මස අවසානය වන විට ගෙවා නිම කර ඇති අතර, ඉතිරි වී ඇති ගෙවීම් වලට අදාළ කටයුතු මේ වන විට සිදුවෙමින් පවතී.

මේ අතර, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක ක්‍රමය (SLDILSS) යටතේ ගෙවනු ලබන උපරිම වන්දි මුදල රුපියල් 600,000 සිට රුපියල් 1,100,000 දක්වා රුපියල් 500,000 ක මුදලකින් වැඩි කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතනයන්හි බලපත්‍ර අවලංගු කළ හෝ අත්හිටවූ අවස්ථාවලදී එම ආයතනවල තැන්පතුකරුවන්ට උපරිම සහන සැලසීමේ අරමුණෙන් මෙම තීරණය ගෙන ඇත.

ආයතනයේ මූල්‍ය තත්ත්වය අඛණ්ඩව පසුබෑමට ලක්වීම, සමාගමේ බුන්වත් තත්ත්වය තීව්‍ර වීම, ආයතනය නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි සාධනීය ආයෝජන යෝජනාවලියක් ඉදිරිපත් නොවීම සහ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක ක්‍රමය යටතේ රුපියල් 500,000කින් වැඩි වූ වන්දි මුදල ආයතනයෙහි ඉතිරි තැන්පත්කරුවන්ට ප්‍රමාදයකින් තොරව ගෙවීමට පහසුකම් සැලසීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්, 2011 අංක 42 දරණ මුදල් ව්‍යාපාර පනතේ 31(1) වන වගන්තිය ප්‍රකාරව, 2021 අප්‍රේල් මස 12 වන දින ප.ව. 5:00 සිට බලපැවැත්වෙන පරිදි ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී ආයතනයෙහි ව්‍යාපාර කටයුතු අත්හිටුවීමට තීරණය කරන ලදී.

ව්‍යාපාර කටයුතු අත්හිටුවීමේ කාල පරිච්ඡේදය තුළදී, මුදල් මණ්ඩලය මඟින් පත් කරන ලද කළමනාකරණ මණ්ඩලය විසින් ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී ආයතනයෙහි කටයුතු කළමනාකරණය කිරීම අඛණ්ඩව සිදු කරනු ඇති අතර, ආයතනයෙහි ඉතිරි තැන්පත්කරුවන්ට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක ක්‍රමය යටතේ වැඩි කරන ලද වන්දි මුදල දිවයින පුරා පිහිටි මහජන බැංකු ශාඛා ජාලය හරහා ගෙවනු ලැබේ. එම වන්දි මුදල් ගෙවීම් ආරම්භ කරන දිනය ආයතනයෙහි තැන්පත්කරුවන්ට නුදුරු අනාගතයේ දී දැනුම් දෙනු ලැබේ. තවද, ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී ආයතනය සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි නියාමන ක්‍රියාමාර්ග දැනුම් දීම යථා කාලයේදී සිදු කරනු ලැබේ. ඉදිරියේදී දැනුම් දීමට කටයුතු කරනු ඇත.

ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී ආයතනයෙන් ණය ලබාගත් සියලු පාර්ශවයන් සිය ගෙවීම් එම ආයතනය නමින් පවතින පහත බැංකු ගිණුම් හරහා පමණක් නියමිත වේලාවට සිදු කළ යුතු අතර එම සියළු ගෙවීම් සම්බන්ධව වාර්තා පවත්වා ගනිමින්, නියමිත ගෙවීම් නිසි පරිදි නොගෙවීම නිසා ඇති විය හැකි නීතිමය ගැටළු මගහරවා ගන්නා ලෙස දැනුම් දෙනු ලැබේ.

| **බැංකුවේ නම** | **ශාඛාව** | **ගිණුම් අංකය** |
|---|---|---|
| සම්පත් බැංකුව | ප්‍රධාන ශාඛාව | 2930013377 |
| කොමර්ෂල් බැංකුව | කොල්ලුපිටිය ශාඛාව | 1107428801 |

2018 සහ 2019 වර්ෂවල සිදු කරන ලද තැන්පතු වලින් 30% ක් ආපසු ගෙවීම් සහ 2021 වසරේදී සිදු කරන ලද ඉතිරි තැන්පතු වලින් 50% ක් ආපසු ගෙවීම් නොලැබුණු තැන්පත්කරුවන්ට, ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී ආයතනයෙහි ව්‍යාපාර කටයුතු අත්හිටුවන කාල සීමාව තුළ එම ආපසු ගෙවීම් ලබා ගැනීමට හැකියාවක් ඇත.

වැඩිදුර පැහැදිලි කිරීම් සඳහා:

| **ආයතනය** | **අවශ්‍යතාව** | **දුරකථන අංක** | **විද්‍යුත් ලිපිනය** |
|---|---|---|---|
| බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව | ව්‍යාපාර කටයුතු අත්හිටුවීම සම්බන්ධ විමසීම් සඳහා | 011 2477504<br>011 2398806<br>011 2398637 | snbfi_query@cbsl.lk |
| නිරාකරණය හා බලගැන්වීමේ දෙපාර්තමේන්තුව | තැන්පතු රක්ෂණ ක්‍රමය යටතේ වන්දි මුදල් ගෙවීම සම්බන්ධ විමසීම් සඳහා | 011 2477261<br>0112 398788 | dred@cbsl.lk |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය | පොදු ගැටළු සම්බන්ධ විමසීම් සඳහා | 011 2477966 | |
| ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී ආයතනය/ මුදල් මණ්ඩලය මඟින් පත්කරන ලද කළමනාකරණ මණ්ඩලය | තැන්පතු, ණය මුදල් ගෙවීම සහ අනෙකුත් සියලු විමසීම් සඳහා | 011 7534800 | info@sfs.lk |